GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 011 2580886/ 0718552552 Fax : 011 2503586
Email : office@gmoa.lk Web : www.gmoa.lk

A CENTURY OF HEALING THE NATION
1926 - 2026
GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

2026.10.19

මාධ්‍ය නිවේදනය

වෛද්‍ය ස්ථාන මාරු සහ පශ්චාත් සීමාවාසික ස්ථානගත කිරීමේ ප්‍රමාදය නිසා සෞඛ්‍ය සේවාව අනතුරේ.

සමස්ත රටම ආවරණය වන පරිදි සමානාත්මතාවයෙන් යුතුව ගුණාත්මක සහ ප්‍රශස්ත වෛද්‍ය සේවයක් පවත්වා ගැනීම අරමුණු කොට ගෙන ශ්‍රී ලංකාවේ වෛද්‍ය සේවය දීප ව්‍යාප්ත සේවාවක් ලෙස ක්‍රියාත්මක වේ.

මෙමඟින් රටේ අගනුවර මෙන්ම පර්යන්ත ප්‍රදේශවලදී ද ප්‍රශස්ත හා ගුණාත්මක සෞඛ්‍ය සේවයක් අඛණ්ඩව පැය 24 පුරා පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත.

සෑම වර්ෂ හතරකටම වතාවක් කුසලතාව මත පදනම්ව ක්‍රියාත්මක වන ශ්‍රේණි වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය වෛද්‍ය සේවය දීප ව්‍යාප්ත සේවාවක් ලෙස පවත්වා ගැනීමේදි තීරණාත්මක සාධකයකි.

මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන වලට යටත්ව ශ්‍රේණි වෛද්‍යවරුන්ගේ ස්ථානමාරු මණ්ඩලය හරහා සිදු කරනු ලබන අතර කාර්යක්ෂම හා විධිමත් ස්ථාන මාරු ක්‍රියාවලියක් වෛද්‍යවරුන්ගේ ක්‍රියාත්මක විමෙහිලා එම ස්ථානමාරු මණ්ඩල විධිමත්ව ක්‍රියාත්මක වීම වැදගත්ය.

එමෙන්ම පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන් ස්ථානගත කිරීම ද සේවා අවශ්‍යතාවයන් ඇතුලු කරුණු ගණනාවක් සලකමින් ආයතන සංග්‍රහයේ විධි විධාන වලට යටත්ව ස්ථානමාරු මණ්ඩලය හරහා සිදු කරනු ලබයි.

මෙම ක්‍රියාවලිය මඟින් දුෂ්කර සහ පර්යන්ත රෝහල්, ප්‍රාථමික සෞඛ්‍ය ඒකක වෙත පවා ප්‍රශස්ත මට්ටමෙන් අඛණ්ඩව වෛද්‍යවරුන් ස්ථානගත කිරීමට හැකියාව ලැබී ඇති අතර සෞඛ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යාමට තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි.

ස්ථානමාරු මණ්ඩලයේ පාර්ශ්වකරුවන් වන සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහභාගී වී අදාළ සෞඛ්‍ය ආයතන පවත්වාගෙන යාමට ඇති අවශ්‍යතාවයන්, ස්ථාන මාරු ක්‍රියාවලිය විධිමත් කිරීම, දුෂ්කර සේවා ස්ථාන පවත්වාගෙන යාම සහ මේ වන විට වසා දමා ඇති හෝ සේවාව සීමා වී ඇති සෞඛ්‍ය ආයතන නැවතත් ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය සේවාවන් පුලුල් කිරීම වැනි අවශ්‍යතා සැපිරෙන පරිදි පශ්චාත් සීමාවාසික වෛද්‍ය ස්ථානගත කිරීම් සහ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරයි.

සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ මෙම වගකීම පැවරී ඇත්තේ අධ්‍යක්ෂ - වෛද්‍ය සේවා වෙතයි. නමුත් මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ බලධාරීන්ගේ අකාර්යක්ෂම හා අත්තනෝමතික ක්‍රියා පිළිවෙල මත මෙම ස්ථානමාරු ක්‍රියාවලියම අර්බුදයට ලක්වී ඇත.

ආයතන සංග්‍රහයේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටිගත රීති වල ප්‍රතිපාදන ප්‍රකාරව වෛද්‍ය ස්ථානමාරු සහ පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන් ස්ථානගත කිරීම සඳහා ස්ථානමාරු මණ්ඩල වල සහභාගිත්වය රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිත්‍යානුකූලව පිළිගනු ලැබ තිබුණ ද, අධ්‍යක්ෂ - වෛද්‍ය සේවා විසින් වගකීම් විරහිතව සහ අත්තනෝමතිකව ක්‍රියා කිරීම නිසා පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන්ගේ ස්ථානගත කිරීම් ප්‍රමාද වීම මෙන්ම වෛද්‍යවරුන්ගේ වාර්ෂික ස්ථාන මාරු අවිධිමත් හා අකාර්යක්ෂම බවට පත්වීම ද සිදුවී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය සහ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් ස්ථානමාරු මණ්ඩල මඟින් ලබා ගන්නා නිත්‍යානුකූල තීරණ නැවතත් අත්තනෝමතික ලෙස වෙනස් කිරීම සහ සමහර අවස්ථාවලදී ස්ථානමාරු මණ්ඩල නොසලකා කටයුතු කිරීම මඟින් පශ්චාත් සීමාවාසික වෛද්‍යවරුන් ස්ථානගත කිරීම මෙන්ම සේවා අඩාළ වීමකින් තොරව වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම ද දැඩි අර්බුදයකට ලක්ව ඇත.

මේ හේතුවෙන් ප්‍රාථමික සෞඛ්‍ය ඒකක ඇතුලු පර්යන්ත රෝහල්වල සේවාවන් බිඳවැටීමේ අවධානමක් මතුවී ඇති අතර වාර්ෂික ස්ථාන මාරු ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටින වෛද්‍යවරුන්ට තම ස්ථාන මාරු ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි තත්ත්වයට පත් වී ඇත.

එමෙන්ම සේවා අවශ්‍යතාවයන් සහ ආයතනික අවශ්‍යතාවයන් නොසලකා සමහර අවස්ථාවල ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම මඟින් සෞඛ්‍ය සේවා සැපයීම ද අර්බුදයට ලක්ව ඇත.

අධ්‍යක්ෂ - වෛද්‍ය සේවා මඟින් සිදු කරන අකාර්යක්ෂම, අවිධිමත් සහ අත්තනෝමතික ක්‍රියාපටිපාටිය නිසාවෙන් මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය අර්බුදයට ලක්වී රෝගී සත්කාර සේවාවන්ට ද බාධා එල්ල වී ඇති අතර එය නැවත නිවැරදි කිරීමට වහාම කටයුතු කළ යුතු බව අවධාරණය කර සිටිමු.

ස්තූතියි.
මීට විශ්වාසී,

වෛද්‍ය යු. කේ. බී. වරකාගොඩ,
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

වෛද්‍ය ලසිත ධම්මික (මාධ්‍ය ප්‍රකාශක)	-	0777611420
වෛද්‍ය ප්‍රභාත් සුගතදාස	-	0714471066
වෛද්‍ය පාලිත රාජපක්ෂ	-	0718480300
වෛද්‍ය චමිල් විජේසිංහ	-	0717080041
වෛද්‍ය හංසමාල් වීරසූරිය	-	0776549339
වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ	-	0716812160
වෛද්‍ය ආර්. තනිගවාසන්	-	0772369608
වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ	-	0777829001
වෛද්‍ය අජන්ත රාජකරුණා	-	0766736296
වෛද්‍ය චාරුනි කොහොඹන්ගේ	-	0714410467
වෛද්‍ය අන්ෆාස් ෆාරූක්	-	0771115117
වෛද්‍ය සංජීව තල්ගහගොඩ	-	0716173330